2 ශ්‍රේණිය

මූලික පිරිවෙන්

# ත්‍රිපිටක ධර්මය

## මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

Mid Term and Year End Papers

**මූලික පිරිවෙන් මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර i-ii**



මූලික පිරිවෙන් ත්‍රිපිටක ධර්මය මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

# ත්‍රිපිටක ධර්මය

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 2 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2018

## Primary Piriven Mid Year Tearm Test - 2018

### ශ්‍රේණිය 02 /Grade 02

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ත්‍රිපිටක ධර්මය කාලය : පැය දෙකයි
Thripitaka Dharmaya Time : Two Hours

සැලකිය යුතුයි :
**I**, **II** කොටස්වල ප්‍රශ්න සියල්ලටම ද **III** කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

I කොටස

i. සිදුහත් බෝසතාණන් ගිහිගෙය අත්හැර ගියේ වයස අවුරුදු කීයේද?

1. වයස 26 දී ය 2. වයස 29 දී ය 3. වයස 35 දී ය

ii. මංගල සූත්‍ර නිදාන කථාවේ සඳහන් දිට්ඨ මංගල යනු

1. ඇසට මුණගැසෙන සුභ නිමිති ය
2. කණට ඇසෙන සුභ නිමිති ය
3. නාසයට දිවට දැනෙන සුභ නිමිති ය

iii. බුදුරජාණන් වහන්සේ අනිමිසලෝචන පූජාව පැවැත්වූයේ

1. පළමු සතියේ ය 2. දෙවෙනි සතියේ ය 3. පස්වන සතියේ ය

iv. බරණැස් සිටුතුමාගේ පුතා කවු ද?

1. විමල 2. සුබාහු 3. යස

v. බුදු සසුනේ ප්‍රථම තේවාචික උපාසකතුමා කවු ද?

1. අනේපිඬු සිටුතුමා 2. බරණැස් සිටුතුමා 3. ධනංජය සිටුතුමා

vi. උරුවෙල් කාශ්‍යප තවුසාට සිටි පිරිවර සංඛ්‍යාව කීය ද?

1. 500 2. 300 3. 200

vii. තුන්බෑජටිල භික්ෂූන් රහත්භාවයට පත්වූයේ කිනම් සූත්‍ර දේශනාවක් ඇසීමෙන් ද?

1. අනත්ත ලක්ඛණ සූත්‍රය 2. ආදිත්තපරියාය සූත්‍රය 3. චුල්ලහත්ථිපදෝපම සූත්‍රය

viii. බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව සිදුකළේ කවු ද?

1. කොසොල් රජතුමා 2. බිම්බිසාර රජතුමා 3. සුද්ධෝදන රජතුමා

ix. බුදුරජාණන් වහන්සේ පළමු වරට කිඹුල්වත් නුවරට වැඩම කරවීමට මූලික වූයේ

1. සුනීධ ඇමැති ය. 2. වස්සකාර ඇමැති ය. 3. කළුදායි ඇමැති ය.

x. බුදුරජාණන් වහන්සේ යසෝදරාවට දේශනා කළ ජාතකය කුමක්ද?

1. අන්ධභූත ජාතකය 2. වෙස්සන්තර ජාතකය 3. තිලමුට්ඨි ජාතකය

(ලකුණු. 2 × 10 = 20)

## II කොටස

මෙම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. බෝසතාණන් වහන්සේට කිරිපිඬු පූජා කළේ කවු ද? ඇය වාසය කළ ගම කුමක් ද?
2. ත්‍රිශික්ෂාව නම් කරන්න.
3. පැවිද්දකු විසින් අත්හල යුතු අන්ත දෙක නම් කරන්න.
4. බුදුරජාණන් වහන්සේ පළමුවන වස් කාලය ගත කළේ කොහේ ද? කවුරුන් සමග ද?
5. මෙය බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම හා දෙවන ලංකා ආගමන සිදු වූයේ කිනම් පොහෝ දිනවලද?
6. චතුසම්පජඤ්ඤයට අයත් අංග දෙකක් නම් කරන්න.
7. ධම්ම පදයට අයත් වග්ග කීය ද? එයට අයත් ගාථා කොපමණ ද?
8. සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලාගේ ගිහි කල නම් මොනවා ද?
9. තුන්බෑ ජටිලයන් නම් කරන්න.
10. මිහිඳු මහ රහතන් වහන්සේ සමග වැඩි පිරිස නම් කරන්න.

(ලකුණු. 2 × 10 = 20)

## II කොටස

01.

i. පහත සඳහන් ගාථාවලින් දෙකක් සම්පූර්ණ කරන්න.

න හි වෙරෙන වෙරානි

යථාගාරං දුච්ඡන්නං

අසාරෙ සාර මතිනො

ii. මින් ඔබ කැමති එක ගාථාවක නිදාන කථාව ලියන්න. (ලකුණු. 10+5 = 15)

02.

i. බුදුරජාණන් වහන්සේ සත්සතිය ගත කළ ස්ථාන ලියන්න.

iii. සත්සතිය තුළ සිදු වූ විශේෂ සිදුවීම් විස්තර කරන්න. (ලකුණු. 7+8 = 15)

03.

i. සීලවිමංස ජාතක කථාවෙන් ගතහැකි ආදර්ශ හතරක් ලියන්න.

iii. සීලවිමංස ජාතක කථාවේ අතීත කථාව ලියන්න. (ලකුණු. 8+7 = 15)

04.

i. භික්ෂූන් වහන්සේ විසින් පිරිය යුතු වත් දහහතර අතරින් හතරක් නම් කරන්න.

ii. ආගන්තුක වත පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු. 8+7 = 15)

05.

i. මංගල සූත්‍රයේ නිදාන කථාව කෙටියෙන් ලියා දක්වන්න.

iii. ''මාතා පිතු උපට්ඨානං'' යන ගාථාව සම්පූර්ණ කොට අදහස ලියන්න. (ලකුණු. 7+8 = 15)

| | |
|---|---|
| | **මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019** |
| | Primary Piriven Mid Year Term Test - 2019 |
| | 1 ශ්‍රේණිය / Grade 1 |
| සියලු ම හිමිකම් ඇවිරිණි) All Rights Reserved) | **ත්‍රිපිටක ධර්මය** කාලය : පැය දෙකයි |
| | **Tripitaka Dharmaya** විභාග අංකය :- ................ Time : Two hours |

❖ සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

01)

01. සිදුහත් කුමරුගේ නම් තැබීමේ උළෙලට බමුණන් කී දෙනෙක් පැමිණියේ ද ?
    i. අට දෙනෙකි ii. එකසිය අට දෙනෙකි iii. සිය දෙනෙකි

02. නිබ්බුත පද කීවේ කවුරුන්ද,
    i. පටාචාරා කුමරිය ii. යසෝදරා කුමරිය iii. කිසා ගෝතමී කුමරිය

03. ජේතවනාරාමය පූජා කළේ කවුරුන් විසින් ද,
    i. අනේපිඬුසිටුතුමා විසිනි ii. මිගාර සිටුතුමා විසිනි iii. පූර්ණවර්ධන සිටුතුමා විසිනි

04. තෙරුවන නමස්කාර කිරීමේදී වඩාත් සුදුසුම ක්‍රමය වන්නේ,
    i. උක්කුටිකයෙන් වැඳීමයි ii. පසඟ පිහිටුවා වැඳීමයි iii. දණ්ඩ නමස්කාරයයි

05. සාම ජාතකයෙහි එන සාම කුමරුගේ පියා ලෙස සැලකෙන්නේ,
    i. දූ කුල ii. ධනංජය iii. අනාථ පිණ්ඩික

06. තිත්තිර ජාතකයට අනුව වැඩිමලා ලෙස සැලකෙන්නේ,
    i. ඇතාය ii. වඳුරාය iii. වටුවාය

07. වැලි දඬුවම් පසට අයත් වන්නකි,
    i. රහමෙරින් දුරුවීම ii. මුසවායෙන් දුරුවීම iii. රන් රිදී කහවුණු පිළිගැනීම

08. ''මාතා යථා නියං පුත්තං'' යන ගාථා පාඨය ඇතුළත් සූත්‍රය වන්නේ,
    i. කරණීය මෙත්ත සූත්‍රයයි ii. රතන සූත්‍රයයි iii. මංගල සූත්‍රයයි

09. මහාමායා දේවිය උපත ලද නගරය,
    i. රජගහ නුවරයි. ii. කිඹුල්වත් නුවරයි. iii. දෙව්දහ නුවරයි.

10. බුද්ධ කාලයේ දඹදිව පැවති උත්සවයකි,
    i. පොසොන් උත්සවය ii. ඇසළ උත්සවය iii. වෙසක් උත්සවය

(ලකුණු 2 x 10 = 20)

02. සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(බුද්ධගයාවේ, තෙරුවන, ජේතවනාරාමයේ,පංචශීලය, චන්න, කුංචනාද, කාලදේවල, දස සීලය, කොණ්ඩඤ්ඤ බමුණා, නන්ද)

i. සිදුහත් කුමරු ඒකාන්තයෙන් බුදුවන බව ප්‍රකාශ කරන ලද්දේ ........................................ විසිනි.

ii. අසිත තාපසතුමා ........................................ නාමයෙන් ද හැඳින්වේ.

iii. සිදුහත් කුමරුගේ රථාචාර්යයා වන්නේ ........................................ ය.

iv. බුදුරජාණන් වහන්සේ වැඩිම කාලයක් වැඩ සිටියේ ........................................ ය.

v. බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වූයේ ........................................ දීය.

vi. බුද්ධ, ධම්ම, සංඝ හැඳින්වීමට ........................................ යන නම ද භාවිතා වේ.

vii. ගිහි බෞද්ධයාගේ නිත්‍ය සීලය ........................................ නම්වේ.

viii. ඇතෙකු නාද කරන හඬ ........................................ යයි.

ix. සාමණේර බවට පත්වීම සඳහා සාමණේර ........................................ සමාදන් විය යුතුය.

x. මහා ප්‍රජාපති ගෝතමියගේ පුත්‍රයා වන්නේ ........................................ කුමරුය.

(ලකුණු 2 x 10 = 20)

03. නිවැරදි වාක්‍ය ඉදිරියෙන් (√) ලකුණ ද, වැරදි වාක්‍ය ඉදිරයෙන් (X) ලකුණ ද වරහන් තුළ යොදන්න.

i. මහාමායා දේවිය කලුරිය කොට තුසිත දෙව්ලොව උපන්නාය. ( )

ii. සිදුහත් කුමරු නාටිකාංගනාවන්ගේ විකාර දැක වඩාත් කළකිරුණේය. ( )

iii. සිදුහත් කුමරු ගිහිගෙයින් නික්ම ගියේ ඡන්න හා කන්ථක අසු සමගය. ( )

iv. අනේපිඬු සිටුතුමා විසින් පූර්වාරාමය පූජා කරන ලදි. ( )

v. තෙරුවන ගුණ සියල්ල 24 කි. ( )

vi. ගිහියාගේ නිත්‍ය ශීලය අටසිල් නම් වේ. ( )

vii. අසිත හා කාලදේවල යනු බමුණු පඩිවරු දෙදෙනෙකි. ( )

viiii. මෙත් වැඩිය යුතු භාවනාව ආනාපානාසති භාවනාව නම් වේ. ( )

xi. මොනෙයය ප්‍රතිපදාව යනු කිසිවකු සමග කතා නොකර සිටීමයි ( )

x. සිදුහත් කුමරු වප් මඟුල් දින ආනාපානාසති භාවනාව වැඩුවේය. ( )

(ලකුණු 1 x 10 = 10)

04. කෙටි පිළිතුරු සපයන්න.

i. සුදොවුන් රජු සිදුහත් කුමරුට සාදා දුන් මාලිගා තුන නම් කරන්න.

..................................................................

ii. සිද්ධාර්ථ යන්නෙහි අර්ථය කුමක්ද ?

..................................................................

iii. සත්තිගුම්බ ජාතකයේ එන ගිරවි දෙදෙනාගේ නම් ලියන්න.

..................................................................

iv. තිත්තිර ජාතකයේ එන සතුන් තිදෙනා නම් කරන්න.

..................................................................

v. ''කිං කුසල ගවේසි'' යන්නෙහි අර්ථය ලියන්න.

..................................................................

(ලකුණු 2 x 5 = 10)

05. බුදුගුණ කීය ද ? ඒවා පිළිවෙළින් ලියන්න.

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

(ලකුණු 1 x 10 = 10)

06. හෙරණහට දසසිල් නම් කවරයත් .............................. පිළිවෙළින් ලියන්න.

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

…………………………………………………………………

…………………………………………………………………

…………………………………………………………………

…………………………………………………………………

**(ලකුණු 1 x 10 = 10)**

**07. පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.**

i. **නිබ්බුතා නූන සා මාතා ....**

…………………………………………………………………

…………………………………………………………………

…………………………………………………………………

…………………………………………………………………

ii. **යේ ච බුද්ධා අතීතා ච ....**

…………………………………………………………………

…………………………………………………………………

…………………………………………………………………

…………………………………………………………………

iii. **සබ්බ පාපස්ස අකරණං .....**

…………………………………………………………………

…………………………………………………………………

…………………………………………………………………

…………………………………………………………………

iv. **කායේන වාචා චිත්තේන ....**

…………………………………………………………………

…………………………………………………………………

…………………………………………………………………

…………………………………………………………………

**(ලකුණු 5 x 4 = 20)**

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍යවාර පරීක්ෂණය - 2022**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2022**
**Mid Year Term Test - 2022**

පැය දෙකයි

**ත්‍රිපිටක ධර්මය** විභාග අංකය : ........................................... **02 ශ්‍රේණිය**

- **I, II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම ද, III කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

## 01. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. ලෝක සත්‍යය සතර ආකාරයකි. එහි **අනුපිළිවෙළ** වරණය වන්නේ,

I. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය.
දුක්ඛ ආර්ය සත්‍යය.
දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය.
දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යය.

II. දුක්ඛ ආර්ය සත්‍යය.
දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යය.
දුක්ඛ සමුදය ආර්ය සත්‍යය.
දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය.

III. දුක්ඛ ආර්ය සත්‍යය.
දුක්ඛ සමුදය ආර්ය සත්‍යය.
දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය.
දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යය.

2. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ **සම්මා වායාම** යනුවෙන් අදහස් වන්නේ,

I. යහපත් දැකීම යි. II. යහපත් උත්සාහය යි. III. යහපත් පැවැත්ම යි.

3. සම්බුදු සසුනේ ප්‍රථම **(තේවාචික)** උපාසකතුමා වූයේ,

I. අනේපිඬු සිටුතුමා ය. II. බරණැස් සිටුතුමා ය. III. කොසොල් රජතුමා ය.

4. බුදුසසුනේ ප්‍රථම ධර්ම දූත පිරිස

I. පස් නමකි. II. හැට නමකි. III. හැට එක් නමකි.

5. බරණැස සිටුතුමාගේ පුතා කවුද ?

I. සුභාහු ය. II. නන්ද කුමරු ය. III. යසකුල පුත්‍රයා ය.

6. උරුවෙල් දනව්වේ දී බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා රහත් බව ලැබුවේ,

I. යසකුල පුත්‍රයා ඇතුලු පිරිස II. භද්දවග්ගිය කුමාරවරුන් ඇතුලු පිරිස

III. තුන් බෑ ජටිලයන් ඇතුලු පිරිස

7. බුදුසසුනෙහි ප්‍රථම ආරාම පූජාව වනුයේ,

I. පූර්වාරාමය ය. II. ජේතවනාරාමය ය. III. වේළුවනාරාමය ය.

8. යසෝදරා කුමරියට සිටි එකම සහෝදරයා වන්නේ,

I. නන්ද කුමරු ය. II. දේවදත්ත කුමරුය. III. රාහුල කුමරුය.

9. යසෝදරා දේවිය බෝසතාණන් වහන්සේගේ **"පාදපරිචාරිකාව"** වීමට පෙරුම් පිරීම අරඹණු ලැබුවේ,

I. මේධංකර පාද මූලයේ ය. II. දීපංකර පාද මූලයේ ය. III. තණ්හංකර පාද මූලයේ ය.

10. **බෞද්ධයාගේ අත්පොත** වන **"ධම්මපදයේ"** ඇතුළත් වග්ග සංඛ්‍යාව වන්නේ

I. 24 කි. II. 25 කි. III. 26 කි.

(ලකුණු 2x10 = 20)

## II කොටස

**02. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1. සත්ත්වයා විසින් සසර දුකින් මිදීමට අත්හළ යුතු අන්ත දෙක නම් කරන්න.
2. බුදු සසුනේ ප්‍රථම රහත් හැට නම නම් කරන්න.
3. තුන් බෑ ජටිලයන් නම් කරන්න.
4. සීලවිමංස ජාතකයෙහි බ්‍රහ්ම දත්ත රජතුමා අන් අයට වඩා පුරෝහිත බමුණාට සලකනු ලැබූ හේතුව සෙවීම සඳහා කළ පරික්ෂණය කුමක් ද ?
5. යසෝදරා දේවියගේ මවගේ හා පියාගේ නම් ලියන්න.
6. සිදුහත් බෝසතාණන් වහන්සේ ගිහිගෙය අතහැර යෑම කිනම් නමකින් හඳුන්වයි ද ?
7. භික්ෂූන් වහන්සේ නමක විසින් සපිරිය යුතු වත් **තුදුස** පිළිබඳ ත්‍රිපිටකයේ සඳහන් වී ඇත්තේ කුමන කාණ්ඩයක ද ?
8. තුදුස් (14) වත් අතුරින් වත් **හතරක්** නම් කරන්න.
9. සැරියුත් හිමියන්ගේ හා මුගලන් හිමියන්ගේ ගිහිකල නාමයන් මොනවාද ?
10. **''සම්පජඤ්ඤ භාවනාව''** යන්නෙහි අර්ථය ලියන්න.

(ලකුණු 2x10 = 20)

## III කොටස

**03.** පහත සඳහන් ගාථාවලින් **තුනක්** සම්පූර්ණ කරන්න.

1. නහී වේරෙන වේරානි .................
2. අනික්කසාවො කාසාවං ......................
3. යථාගාරං දුච්ඡන්නං ........................
4. ඉධ මෝදති පෙච්ච මෝදති ...................

(ලකුණු 5 x 3 = 15)

04. I. මහාමංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු **තුනක්** ලියන්න.

II. මංගල සූත්‍රය දේශනා කිරීමට හේතු වූ නිදාන කතාව කෙටියෙන් ලියන්න.

(ලකුණු 6 + 9 = 15)

05. I. යසෝදරා දේවියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ **තුනක්** ලියන්න.

II. යසෝදරා දේවියට ''**චන්දකින්නර ජාතකය**'' දේශනා කළ හේතුව ලියන්න.

(ලකුණු 6 + 9 = 15)

06. I. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ චරිතයෙන් භික්ෂු ජීවිතයට ගතහැකි ආදර්ශ **තුනක්** ලියන්න.

II. චණ්ඩාශෝක ධර්මාශෝක වූ කථා පුවත ලියන්න.

(ලකුණු 6 + 9 = 15)

07. II. සීලවිමංස ජාතක කථාව කෙටියෙන් ලියන්න.

II. සිල් රැකීමේ ආනිසංස එම ජාතක කථාව ඇසුරින් පෙන්වා දෙන්න.

(ලකුණු 6 + 9 = 15)

08. I. සතර සතිපට්ඨානය නම් කරන්න.

II. පටික්කුල මනසිකාරය (පිළිකුල් භාවනාව) වඩන ආකාරය ලියන්න.

(ලකුණු 6 + 9 = 15)

★ ★ ★

[සියලුම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය** - 2023
**இரண்டாம் தவணைப் பரீட்சை** - 2023
**Mid Year Term Test** - 2023

**පැය දෙකයි**

**ත්‍රිපිටක ධර්මය** **විභාග අංකය : ..............................** **02 - ශ්‍රේණිය**

- **I, II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම ද, III වන කොටසින් ප්‍රශ්න හතරකට ද, පමණක් පිළිතුරු සපයන්න.**

## I - කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. සිද්ධාර්ථ බෝධිසත්ව කුමාරයා "මහාභිනිෂ්ක්‍රමණය" කළේ ................................ පොහෝ දිනයේ ය.
   i. වෙසක් ii. පොසොන් iii. ඇසළ

2. බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයෙන් පසු පළමු සතිය ගත කළේ,
   i. බෝමැඩ මුල ය. ii. අජපාල නුග රුක මුල ය. iii. රාජායතන කිරිපලු රුක මුල ය.

3. ලෝක සත්ත්වයාට දහම් දෙසන ලෙස, බුදුරජාණන් වහන්සේට ................... බ්‍රහ්ම රාජයා විසින් ආරාධනා කළේ ය.
   i. නාරද ii. සහම්පතී iii. උපක

4. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව වූයේ,
   i. අනන්ත ලක්ඛණ සූත්‍රය යි. ii. දම්සක්පැවතුම් සූත්‍රය යි. iii. මහා මංගල සූත්‍රය යි.

5. බුදුරජාණන් වහන්සේ **"මහා ධර්මපාල ජාතකය"** දේශනා කළේ,
   i. කොසොල් මහරජුට ය. ii. සුද්ධෝදන මහරජුට ය. iii. බිම්බිසාර මහරජුට ය.

6. **"ද්වත්තිංසාකාරය"** මෙනෙහි කිරීමෙන් මාතික මාතාව .......................... මාර්ගඵලයට පත් වූවා ය.
   i. සෝවාන් ii. සකෘදාගාමී iii. අනාගාමී

7. සීලය මඟින් සංවර වන්නේ,
   i. සිත සහ කය යි. ii. කය සහ වචනය යි. iii. වචනය සහ සිත යි.

8. නිග්‍රෝධ කුමරු පැවිදි කළේ ............................... උපාධ්‍යායත්වයෙන් ය.
   i. වරුණ තෙරුන්ගේ ii. සුමන තෙරුන්ගේ iii. මොග්ගලීපුත්තතිස්ස තෙරුන්ගේ

9. ධම්මපද ග්‍රන්ථයේ ඇතුළත් සියලු ගාථා ප්‍රමාණය වන්නේ,
   i. හාරසිය විසි දෙක කි. ii. හාරසිය විසි තුන කි. iii.හාරසිය විසි හතර කි.

10. බුදුරජාණන් වහන්සේ පළමු වරට ලක්දිවට වැඩම කළේ,
    i. මහියංගණයට ය. ii. නාගදීපයට ය. iii. කැලණියට ය.

**(ලකුණු 2X10 = 20)**

## II - කොටස

**02. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. භාවනාවේ ප්‍රභේද **දෙක** නම් කරන්න.

ii. පැවිද්දෙකු විසින් අත්හළ යුතු **අන්ත** දෙක ලියන්න.

iii. ආර්ය මාර්ග අංග අටෙන් **දෙකක්** ලියා දක්වන්න.

iv. **"මංගල ධර්ම දේශනය"** අවසානයේ පළමු වතාවේ ම සෝවාන් බවට පත් වූ තවුසාගේ නම කුමක් ද ?

v. යසකුල පුත්‍රයාගේ යහළුවන් **දෙදෙනෙකු** නම් කරන්න.

vi. බුදුරජාණන් වහන්සේ විසින් යශෝධරා දේවියට දේශනා කළ **ජාතකය** කුමක් ද?

vii. තථාගතයන් වහන්සේ විසින් **"තිරෝකුඩ්ඩ සූත්‍රය"** දේශනා කළේ කාහට ද?

viii. දේවදත්ත හිමියන් විසින් ශාස්තෘන් වහන්සේගෙන් ඉල්ලූ **"පංච වරයන්"** අතරින් **දෙකක්** ලියන්න.

ix. තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන් විසින් කේශ ධාතු තැන්පත් කොට ලක්දිව ඉදි කළ දාගැබ පිහිටි ස්ථානය ලියන්න.

x. **"චතු සම්පජඤ්ඤය"** අතරින් **දෙකක්** නම් කරන්න.

**(ලකුණු 2X10 = 20)**

## III - කොටස

**3. පහත සඳහන් ගාථාවලින් තුනක් සම්පූර්ණ කරන්න.**

i. පරේචන විජානන්ති .............................

ii. අසාරේ සාර මතිනෝ .............................

iii. අනික්කසාවෝ කාසාවං .........................

iv. ඉධ නන්දති පෙච්ච නන්දති .......................

**(ලකුණු 5×3 =15)**

4. i. ධර්මපාල ජාතකයට අනුව දිගාසිරි ලැබීමට හේතු වන කරුණු **හයක්** ලියන්න.

ii. **"ධර්මපාල ජාතකය"** දේශනා කිරීමට හේතු වූ නිදාන කතාව කෙටියෙන් ලියන්න.

**(ලකුණු 6+9 = 15)**

5. i. **"තුදුස් වත්"** අතරින් **හයක්** නම් කරන්න.

ii. ශිෂ්‍යයා විසින් ගුරුවරයා වෙත ඉටු කළ යුතු වත පිළිබඳ විස්තර කරන්න.

**(ලකුණු 6+9 = 15)**

6. i. **"මහා මංගල"** සූත්‍රයෙහි ඇතුළත් මංගල කරුණු **හයක්** ලියන්න.

ii. මව්පිය උපස්ථානයෙහි වටිනාකම පැහැදිලි කරන්න.

**(ලකුණු 6+9 = 15)**

7. i. **"තච පඤ්චකය"** පිළිවෙළින් ලියන්න.

ii. පිළිකුල් භාවනාව වඩන ආකාරය විස්තර කරන්න.

**(ලකුණු 6+9 = 15)**

8. i. වැඳූ මව් අතහැර පැමිණි භික්ෂුවට දායිකා මව්වරුන්ගෙන් ලැබෙන මව් සෙනෙහස පිළිබඳ මාතික මාතාවගේ කතාව ඇසුරින් පැහැදිලි කරන්න.

ii. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ **පහක්** ලියන්න.

**(ලකුණු 6+9 = 15)**

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையதுஸ]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - சிறப்புக் கல்விப் பிரிவு

| 03 | S | I |
|---|---|---|

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2024

## 02 ශ්‍රේණිය

පැය දෙකයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## (03) ත්‍රිපිටක ධර්මය

**සැලකිය යුතුයි :**
* **මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් ලැබේ.**
* **දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**
* **I, II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම ද, III කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකට ද පමණක් පිළිතුරු සපයන්න.**

### I - කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

1. මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවිදි රුවක් යනු ..........................
   1. සතර අගති ය. 2. සතර පෙරනිමිති ය. 3. සතර කර්මක්ලේෂ ය.

2. දන්ගේ (දානශාලාව) පිළියෙළ කිරීම හා දන් පිළිගන්නා වෙලාවේ අනුගමනය කළ යුතු පිළිවෙත් ඇතුළත් වන්නේ,
   1. ආවාසික වතෙහිය. 2. හත්තගග වතෙහිය. 3. අනුමෝදනා වතෙහිය.

3. බුදුරාජාණන් වහන්සේ සත් සතියේ සිව් වන සතිය ............................ වැඩ සිටි සේක.
   1. රාජායතන රුක් මුල 2. රුවන් ගේ (රතනාඝර) 3. අජපාල නුගරුක මුල

4. ශරීරයට සැප දෙමින් දුක යටපත් කිරීමේ වෑයම හැඳින්වෙන්නේ ........................... ලෙස ය.
   1. කාමසුඛල්ලිකානුයෝගය 2. අත්තකිලමථානුයෝගය 3. පුබ්බෙනිවාසානුස්සතිය

5. නිග්‍රෝධ කුමරු පැවිදි වූයේ ................................... තෙරුන්ගේ ආචාර්යත්වයෙනි.
   1. මොග්ගලී පුත්තතිස්ස 2. මහා වරුණ 3. අනුරුද්ධ

6. **"ඉවසීම ද, කීකරු බව ද"** උතුම් මංගල කරුණු බව පෙන්වා දෙන ගාථා පාඨය ඇතුළත් වරණය වන්නේ,
   1. තපෝ ච බ්‍රහ්මචරියං ච 2. ඛන්තී ච සෝවචස්සතා 3. ඵුට්ඨස්ස ලෝක ධම්මේහි

7. දෙතිස් කුණපයෙන් යුතු මේ සිරුර පිළිබඳ මෙනෙහි කිරීම .......................... යනුවෙන් හඳුන්වනු ලැබේ.
   1. ධම්මානුස්සති 2. කායගතාසති 3. බුද්ධානුස්සති

8. දෙව්දත් තෙරුන් අනාගතයේ දී ................................ නමින් පසේ බුදු බව ලබන්නේය.
   1. කකුසඳ 2. දීපංකර 3. සට්ඨිස්සර

9. උරුවෙල කාශ්‍යප, නදී කාශ්‍යප හා ගයා කාශ්‍යප යන තුන්බෑ ජටිලයෝ ..................... සූත්‍රය අසා රහත් වූහ.
   1. අනත්තලක්ඛණ 2. දම්සක්පැවතුම් 3. ආදිත්තපරියාය

10. කිරිපිඩු දානය වැළඳූ බෝසතාණන් වහන්සේ එම රන්තලිය ......................... දැමූ විට උඩුගං බලා ගියේ ය.
   1. අනෝමා නදියට 2. නේරංජනා නදියට 3. අචිරවතී නදියට

(ලකුණු 2 x 10 = 20)

## II - කොටස

**02. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

I. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි අංග දෙකක් නම් කරන්න.

II. බුදුරදුන්ගේ මංගල ධර්ම දේශනාව අසා පළමු ව ධර්මාවබෝධය ලැබූ තවුසා නම් කරන්න.

III. බුදුසසුනේ ප්‍රථම තේවාචික උපාසකතුමා නම් කරන්න.

IV. දේවදත්ත හිමියන් ඉදිරිපත් කළ පංචවර අතරින් දෙකක් ලියන්න.

V. බුදුරාජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවකයන් වහන්සේලා දෙනම නම් කරන්න.

VI. යශෝදරා තෙරණිය ලැබූ අගතනතුර කුමක් ද?

VII. **"චතුසම්පජඤ්ඤය"** අතරින් දෙකක් ලියන්න.

VIII. උපතිස්ස කෝලිත යහළුවන් දෙදෙනාට පැවිදි වීමට හේතු වූ සැණකෙළිය කුමක් ද?

IX. චතුරාර්ය සත්‍ය අතරින් දෙකක් නම් කරන්න.

X. බුද්ධත්වයෙන් පස්වන සතියේ සිදු වූ විශේෂ සිදුවීම් දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

## III - කොටස

**03. පහත සඳහන් ගාථා අතරින් තුනක් සම්පූර්ණ කරන්න.**

I. න හි වේරේන වේරානි ..............................
II. යෝ ච වන්ත කසාවස්ස ............................
III. ඉධ සෝචති පෙච්ච සෝචති ...................
IV. ඉධ නන්දති පෙච්ච නන්දති .................... (ලකුණු 3x5 = 15)

**04.** I. ගෞතම බුදුසසුනේ ප්‍රථම රහත් හැට නමට අයත් පිරිස නම් කරන්න.
II. එම හැට නම අමතා බුදුන් වහන්සේ දුන් උපදෙස් ඇතුළත් පාලි පාඨය ලියන්න.

(ලකුණු 6+9 = 15)

**05.** I. තුදුස් වත් අතරින් තුනක් නම් කරන්න.
II. ඉහත නම් කරන ලද වත් අතරින් දෙකක් පිළිබඳ හඳුන්වන්න.

(ලකුණු 6+9 = 15)

**06.** I. සිල්වත් වීමේ ආනිසංස තුනක් ලියන්න.
II. භෞතික සම්පත්වලින් යුක්ත වීමට වඩා සිල්වත් වීමේ අගය සීලවීමංස ජාතකය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6+9 = 15)

**07.** I. දෙතිස් කුණප අතරින් හයක් නම් කරන්න.
II. චතුරංග සමන්නාගත වීර්යය නම් කර, උත්සාහ වීමේ අගය පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 6+9 = 15)

**08.** I. දිගාසිරි වීමට බලපාන කරුණු තුනක් මහා ධර්මපාල ජාතය ඇසුරින් ලියන්න.
II. පිරිස ඇති හෝ නැති තැන ආත්ම දමනයෙන් කටයුතු කිරීමේ අගය මාතික මාතා කතාව ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6+9 = 15)

# ත්‍රිපිටක ධර්මය

## අවසන් වාර ප්‍රශ්න පත්‍ර - 4 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් අවසානවාර පරීක්ෂණය - 2018

## Primary Piriven Year End Test - 2018

### ශ්‍රේණිය 02/Grade 02

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ත්‍රිපිටක ධර්මය
Thripitaka Dharmaya

කාලය : පැය දෙකයි
Time : Two Hours

ත්‍රිපිටක ධර්මය

I, II කොටස්වල ප්‍රශ්න සියල්ලටම ද, III කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

### I කොටස

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. බුදුරජාණන් වහන්සේට පළමුව විලඳ හා මීපිඬු පූජා කිරීම සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ,

i. උපක, තපස්සු ii. තපස්සු, භල්ලුක iii. භල්ලුක, සේරිවාණිජ

02. අතීතයේ මංගල යැයි සම්මත කරගත් කරුණු කීය ද?

i. තුනකි ii. හතරකි iii. දෙකකි

03. බුදුරදුන් කිඹුල්වත්පුරයට වැඩම කළේ භික්ෂූන් වහන්සේලා කී නමක් පිරිවරා ගෙන ද?

i. දසදහසක් ii. විසිදහසක් iii. පසළොස් දහසක්

04. ''ස්වාමිනී දැන් ගස් වැල්වල පැරණි කොළ හැලී, ගිනි අඟුරු වැනි මල්, දලු හටගෙන පල දැරීමටත් ලං වී තිබෙයි'' මෙය කියන ලද්දේ කවුරුන් විසින් ද?

i. යස තෙරුන් ය ii. කොණ්ඩඤ්ඤ තෙරුන් ය iii. කාළුදායි තෙරුන් ය

05. මහා ධර්මපාල ජාතකය දේශනා කරන ලද්දේ කවුරුන් අරභයා ද?

i. සුද්ධෝදන රජු ii. බිම්බිසාර රජු iii. අජාසත් රජු

06. මෞර්ය රාජවංශයේ ආරම්භකයා වන්නේ,

i. චන්ද්‍රගුප්ත රජු ය ii. බින්දුසාර රජු ය iii. අශෝක රජු ය

07. තුන්වන ධර්ම සංගායනාව සඳහා මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ,

i. මහා කාශ්‍යප තෙරුන් ය ii. මොග්ගලීපුත්ත තිස්ස තෙරුන් ය iii. ආනන්ද තෙරුන් ය

08. පරිමණ්ඩල වග්ගයට අයත් සේඛියා ගණන කෙතෙක් ද?

i. දහතුනකි ii. දහයකි iii. දොළහකි

09. ලෝක සත්වයනට දහම් දෙසන ලෙස බුදුරදුන්ගෙන් පළමු ව ඉල්ලා සිටියේ,

i. සහම්පතී මහා බ්‍රහ්මයා ය ii. සටීකාර බ්‍රාහ්මණයා ය iii. සච්චක බ්‍රාහ්මණයා ය

10. බුදුරජාණන් වහන්සේ රුවන් සක්මන සිදුකළේ,

i. දෙවන සතියේ ය ii. තෙවන සතියේ ය iii. සිව්වන සතියේ ය

(ලකුණු 2×10=20)

## II කොටස

මෙම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. ''තෙල, ඔය වජ්‍රාසනය තොපට අයත් නොවේ. එය මගේ'' යැයි ගර්ජනා කළේ කවුරුන් ද?

ii. බුදුරජාණන් වහන්සේ සත් සතියෙහි දෙවන සතියේ දී ලොවට හෙළි කළ ගුණය කුමක් ද?

iii. අනත්ත ලක්ඛණ සූත්‍ර දේශනාවේ ඇතුළත් ත්‍රිලක්ෂණ නම් කරන්න.

iv. අසේවනා ච බාලානං යන ගාථාවේ එන මංගල කරුණු දෙකක් සඳහන් කරන්න.

v. ප්‍රථම ධර්ම දූත හැටනම නම් කරන්න.

vi. යසෝධරා දේවියගේ දෙමාපියන් කවුද?

vii. ධම්ම පදයට අයත් වග්ග හා ගාථා කොපමණ ද?

viii. බුද්ධ ධර්මය පිටක වශයෙන් කොටස් තුනකි. එය නම් කරන්න.

ix. භාවනාව කුමක්දැයි හඳුන්වන පාලි පාඨය ලියා දක්වන්න.

x. භික්ෂූන් වහන්සේ විසින් සපිරිය යුතු වත් තුදුසක් දක්වා ඇති ඛන්ධකය ලියා දක්වන්න.

(ලකුණු 2×10=20)

## III කොටස

01. පහත සඳහන් ගාථාවලින් දෙකක් සඳහන් කරන්න.

i.
- පරෙ ච න විජානන්ති .............
- උට්ඨානවතො සතිමතො .............
- ඉධ මොදති පෙච්ච මොදති .............
- ඉධ නන්දති පෙච්ච නන්දති .............

ii. මින් ඔබ කැමති එක ගාථාවක නිදාන කථාව ලියන්න.

(ලකුණු 5+5+5=15)

02. i. චතුරාර්ය සත්‍යය පිළිවෙළින් නම් කරන්න.

ii. ඉන් ඔබ කැමති ආර්ය සත්‍යයක් විස්තර කරන්න.

(ලකුණු 5+10=15)

03. i. දුතියම්පි භද්‍රමධනස්ස ..... යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. සෝණක ජාතකයෙන් භික්ෂු ජීවිතයට ගත හැකි ආදර්ශ විස්තර කරන්න.

(ලකුණු 5+10=15)

04. i. සිල්වත්කමෙහි අගය කෙටියෙන් පහදන්න.

ii. සක්කච්ච වග්ගයේ එන සේඛියා ශික්ෂා පහක් තේරුම සහිතව ලියන්න.

(ලකුණු 5+10=15)

05. i. තච පඤ්චකය පිළිවෙළින් නම් කරන්න.

ii. ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකු වශයෙන් සිහිකල්පනාවෙන් වැඩ කිරීම ඉදිරි දියුණුව සඳහා හේතු වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 5+10=15)

06. i. ආනන්ද මහ රහතන් වහන්සේ දැරූ අගතනතුරු මොනවා ද?

ii. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ චරිතයෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ යන මැයෙන් රචනයක් ලියන්න.

(ලකුණු 5+10=15)

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven final Year Test - 2019

2 වසර / Grade 2

**ත්‍රිපිටක ධර්මය**
**Thripitaka Dhamma**

කාලය : පැය දෙකයි
Time : Two hours

විභාග අංකය : ..............................................

I, II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම ද III කොටසින් ප්‍රශ්න හතරකට ද පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. බුදුරජාණන් වහන්සේ මියගිය ඥාතීන්ට පින්දීම මූලික කරගෙන බිම්බිසාර රජුට දේශනා කළේ
    i. අනත්ත ලක්ඛණ සූත්‍රය යි. ii. තිරෝකුඩ්ඩ සූත්‍රය යි. iii. මහා මංගල සූත්‍රය යි.

02. බුදුරදුන් උපන් ගමට වැඩම කරන ලද්දේ කිනම් පොහොය දිනයක දී ද?
    i. මැදින් පොහොය දිනක දී ය. ii. නවම් පොහොය දිනක දී ය. iii. වෙසක් පොහොය දිනක දී ය.

03. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කාන්තාවකට මෙම සසුනෙහි පැවිදිව සතර මගඵල පසක් කරන්නට නො හැකි වේදැ යි විමසූහ." මෙය විමසන ලද්දේ
    i. ආනන්ද තෙරුන් ය. ii. මුගලන් තෙරුන් ය. iii. සැරියුත් තෙරුන් ය.

04. සෝණක ජාතකයේ එන කුමාරවරු දෙදෙනාගේ නම් දක්වා ඇති නිවැරදි පිළිතුර වන්නේ
    i. සෝණක කුමරු, පන්සිළු කුමරු ii. අරින්දම කුමරු, සෝණක කුමරු iii. පන්සිළු කුමරු, දීඝායු කුමරු

05. මෞර්ය රාජවංශයේ ආරම්භක රාජ්‍ය පාලකයා
    i. බින්දුසාර රජු ය. ii. චන්ද්‍රගුප්ත රජු ය. iii. අශෝක රජු ය.

06. යශෝධරා දේවියට බුදුරදුන් දේශනා කළ ජාතක දේශනාව වන්නේ
    i. සීලවීමංස ජාතකය යි. ii. මහා ධර්මපාල ජාතකය යි. iii. චන්දකින්නර ජාතකය යි.

07. **'උට්ඨානවතෝ සතිමතෝ'** යන ධම්මපද ගාථාව දේශනා කළේ කාහට ද?
    i. කුම්භඝෝෂකට ය. ii. මාගන්දියාට ය. iii. චූල්ල පන්ථකට ය.

08. **පත්තසඤ්ඤී පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා** යන සේඛියා පාඨ ඇතුළත් වන්නේ
    i. කබල වර්ගයේ ය. ii. සක්කච්ච වර්ගයේ ය. iii. පරිමණ්ඩල වර්ගයේ ය.

09. තච පංචකය පිළිවෙලින් ඇති වර්ණය වන්නේ
    i. කේසා, ලෝමා, දන්තා, නඛා, තචෝ ii. කේසා, ලෝමා, නඛා, තචෝ, දන්තා
    iii. කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ

10. 'සියළු ලෝවැසියන්ගේ යහපතට වැඩ කිරීම තරම් ලොකු වැඩක් නැත' යන ශ්‍රේෂ්ඨ වැකිය අශෝක රජු ලියා තැබූයේ
    i. කාලිංග ලිපියේ ය. ii. ගිරිනාර් ලිපියේ ය. iii. අලහබාද් ලිපියේ ය.

(ලකුණු 2 x 10=20)

## II කොටස

මෙම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. මහා ශ්‍රමණය, අපට නම් බරක් නැත. එහෙත් එහි වෙසෙන විෂඝෝර නාගයාගෙන් ඔබට හිරිහැර වීමට ඉඩ ඇතැයි කී ය. මෙය කවුරුන් විසින් කාහට කියන ලද්දක් ද?

ii. **උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය** යන ගාථාව දේශනා කළේ කාහට ද? ඔහු එයින් ලැබූ මාර්ග ඵලය නම් කරන්න.

iii. ආනන්ද තෙරුන් ලැබූ අගතනතුරු දෙකක් නම් කරන්න.

iv. ත්‍රිශික්ෂාව නම් කරන්න.

v. ධර්මාශෝක රජු නිතර වන්දනා චාරිකාවේ ගොස් වන්දනා කළ ස්ථාන හතර නම් කරන්න.

vi. **දානං ච ධම්මචරියා ච** යන මංගල සූත්‍ර ගාථාවේ එන මංගල කරුණු දෙකක් සඳහන් කරන්න.

vii. තුන් ආකාර වූ තණ්හාව පිළිවෙලින් සඳහන් කරන්න.

viii. බුදුරජාණන් වහන්සේ සත් සතිය ගත කිරීමේදී තෙවන සතියේ සිදු කළ සුවිශේෂී කාර්යය කුමක් ද?

ix. පැවිද්දා විසින් අත්හළ යුතු අන්ත දෙක නම් කරන්න.

x. **චක්කංව වහතෝ පදං** යන්නෙහි සරල අර්ථය ලියන්න.

(ලකුණු 2 x 10=20)

## III කොටස

01. i. පහත සඳහන් ගාථාවලින් **දෙකක්** සම්පූර්ණ කරන්න.

- උට්ඨානවතෝ සතිමතෝ ......
- ඉධ සෝචති පෙච්ච සෝචති .....
- යෝ ච වන්ත කසාවස්ස .....
- උට්ඨානේනප්පමාදේන .....

ii. මින් ඔබ කැමති එක් ගාථාවක නිදාන කථාව ලියන්න.

(ලකුණු 10 + 5 =15)

02. i. බුදු සසුනේ පළමු ආරාම පූජාව පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

ii. බෝසතාණන් වහන්සේ සමග ම උපන් සහජාත වස්තූන් අතුරින් පහක් ලියන්න.

iii. බුදුරදුන් කිඹුල්වත් පුරයට වැඩම කළ මොහොතේ ශාක්‍යයන්ගේ මානය දුරුකිරීම පිණිස සිදුකළ ආශ්චර්යය විස්තර කරන්න.

(ලකුණු 5 + 5 + 5 =15)

03. i. '**තතියම්පි හදමධනස්ස .....** යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එහි අර්ථය ලියා දක්වන්න.

iii. සෝණක ජාතකයෙන් ජීවිතයට ගත හැකි ආදර්ශ පෙන්වා දෙමින් එම ජාතක කථාව ඔබේ මතකයෙන් ලියන්න.

(ලකුණු 5 + 4 + 6=15)

04. i. සේඛියා ධර්මවල ඉගැන්වෙන ආචාරධර්ම පුහුණු කිරීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන පෙන්වා දෙන්න.

ii. පරිමණ්ඩල වග්ගයේ එන සේඛියා ශික්ෂාපද පහක් තේරුම සහිතව ලියන්න.

(ලකුණු 5 + 10=15)

05. i. ආනන්ද මහරහතන් වහන්සේ සතු විශේෂ ගුණාංග මොනවාදැයි පැහැදිලි කරන්න.

ii. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ චරිතාදර්ශය තුළින් ශිෂ්‍ය ආකල්ප දියුණු කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 6 + 9=15)

06. i. '**මහාසම්පත්ති සම්පත්තා**'යන ගාථාව සම්පූර්ණ කර අර්ථ දක්වන්න.

ii. සත්ත්වයා මරණයට පත්වන වේලාවක්, තැනක්, ලොකු කුඩා භේදයක් නැත. කාටත් සිදුවන මෙම ධර්මතාව පිළිබඳව මරණානුස්සති භාවනාව ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6 + 9=15)

*****

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

Primary Piriven Year End Test - 2020

2 ශ්‍රේණිය / Grade 2

(සියලු ම හිමිකම් ඇවිරිණි)
(All Rights Reserved)

**ත්‍රිපිටක ධර්මය** කාලය : පැය දෙක යි

**Thipitaka Dhamma** විභාග අංකය :- ……………. Time : Two hours

I, II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම ද III කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

## I කොටස

**01.** නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. 'මේ මහණකම සම්බාධකවලින් තොර යි, සැහැල්ලු යි. එන්න, මම ඔබට ඒ ගැන කියා දෙමි'යි බුදු රජාණන් වහන්සේ වදාළේ,
    i. බරණැස් සිටුතුමාට ය. ii. යසකුල පුත්‍රයාට ය. iii. කොණ්ඩඤ්ඤ තවුසාට ය.

02. බුදුරජාණන් වහන්සේ විසින් උරුවේල කාශ්‍යපතුමන්ව පෙර දවසත් දමනය කළ බව වදාරා දෙසූ ජාතක කතාව වන්නේ
    i. මහා ධර්මපාල ජාතකය යි. ii. සීලවිමංස ජාතකය යි. iii. මහා නාරද කාශ්‍යප ජාතකය යි.

03. බෝසතාණන් වහන්සේ උපදවාගත් ඥාණ අතුරින් සත්වයන්ගේ ඉපදීම, මියයෑම, සුගති, දුගති ආදිය දතහැකි නුවණ වන්නේ,
    i. දිබ්බචක්ඛු ඥාණය ii. පුබ්බේනිවාසානුස්සති ඥාණය iii. ආසවක්ඛය ඥාණය

04. සත්සතිය ගෙවා නිම වූ බුදුරජාණන් වහන්සේ රාජායතනයෙන් පිටවී වැඩම කළේ,
    i. රුවන් සක් සක්මන ට ය. ii. අජපාල නුගරුක මුලට ය. iii. කිරිපලු රුක් මුලට ය.

05. ඔබේ ඉඳුරන් ප්‍රසන්න ය, ඔබේ ශරීර වර්ණය පැහැපත් ය. ඔබගේ ගුරුවරයා කවරෙක් ද? ඔබ අදහන්නේ කවර ධර්මයක් දැ යි බුදුරජාණන් වහන්සේගෙන් විමසුවේ,
    i. හුහුංක ජාතික බ්‍රාහ්මණයා ය. ii. බරණැස් සිටුතුමා ය. iii. උපක ආජීවකයා ය.

06. 'මහා ශ්‍රමණය, අපට නම් බරක් නැත. එහෙත් එහි වෙසෙන විෂඝෝර නාගයාගෙන් ඔබට හිරිහැර වීමට ඉඩ ඇතැ'යි යන ප්‍රකාශය කරන ලද්දේ,
    i. ගයා කාශ්‍යපතුමා ය. ii. උරුවෙල් කාශ්‍යපතුමා ය. iii. නදී කාශ්‍යපතුමා ය.

07. බුදුරජාණන් වහන්සේ විසින් යශෝධරා දේවියට දේශනා කළ ජාතක කතාව කුමක් ද?
    i. වෙස්සන්තර ජාතකය ii. චන්ද කින්නර ජාතකය iii. සීලවීමංස ජාතකය

08. ධම්ම පදයේ අප්පමාද වග්ගයේ දැක්වෙන **අප්පමාදෝ අමතපදං** යන ගාථාව දේශනා කළේ,
    i. ධර්මාශෝක රජතුමාට ය. ii. සුද්ධෝදන රජතුමාට ය. iii. සුප්‍රබුද්ධ රජතුමාට ය.

09. **සෝසානික ධූතාංගය** සමාදන්වී රාත්‍රී යාමයෙහි සොහොනෙහි හිඳ බවුන් වඩා රහත් වූයේ
    i. චූලකාල තෙරණුවෝ ය. ii. මහාකාල තෙරණුවෝ ය. iii. තිස්ස තෙරණුවෝ ය.

10. චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අග තනතුරු ලැබුවේ,
    i. යසෝධරා තෙරණිය යි. ii. ප්‍රජාපතී ගෝතමී තෙරණිය යි. iii. උප්පලවණ්ණා තෙරණිය යි.

(ලකුණු 2 x 10=20)

II කොටස

02. මෙම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. උක්කලා නුවර සිට බුදුරදුන් හමුවට ආ වෙළෙඳ දෙබෑයෝ නම් කරන්න.

ii. ජටිල තාපස සොහොයුරන් තිදෙනාගෙන් දෙදෙනකු නම් කරන්න.

iii. ආනන්ද මහ රහතන් වහන්සේ විසින් දරන ලද අගතනතුරු දෙකක් දක්වන්න.

iv. යසෝදරා දේවියගේ දෙමව්පියන් නම් කරන්න.

v. ධර්මධර විනයධර භික්ෂූන්වහන්සේලා සමඟි කිරීමට බුදුරදුන් වදාළ ජාතක කතා දෙක නම් කරන්න.

vi. **ගිරග්ග සමජ්ජ** නම් සැණකෙළිය බලන්නට ගිය බමුණු කුමාරවරුන් දෙදෙනා කවුරුන් ද?

vii. අනේපිඬු සිටුතුමාගේ දියණිවරු තිදෙනාගෙන් දෙදෙනෙකු නම් කරන්න.

viii. බෝසතාණන් වහන්සේට **නේවසඤ්ඤානාසඤ්ඤායතනය** දක්වා අෂ්ට සමාපත්ති පුරුදු පුහුණු කළ ගුරුවරු දෙපළ කවුරුන් ද?

ix. **යේ ධම්මා හේතුප්පභවා** යන ගාථාව අසා සෝවාන් වූ බමුණු කුමාරවරු දෙපළ නම් කරන්න.

x. **ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී** යන පාලි පාඨයේ අර්ථය ලියන්න.

(ලකුණු 2x10=20)

III කොටස

03. i. පහත සඳහන් ගාථාවලින් **දෙකක්** සම්පූර්ණ කරන්න.

- නහි වේරේන වේරානී ......
- යථාගාරං දුච්ඡන්නං .....
- ඉධ සෝචති පෙච්ච සෝචති .....

ii. මින් ඔබ කැමති එක් ගාථාවක නිදාන කථාව ලියන්න.

(ලකුණු 10+5=15)

04. i. ධර්මාශෝක මහ රජතුමා බුදු දහම වැළඳගත් ආකාරය කෙටියෙන් පහදන්න.

ii. ධර්මාශෝක රජතුමා විසින් බුදු සසුනට කළ මෙහෙවර පිළිබඳ විස්තරයක් කරන්න.

(ලකුණු 7+8 =15)

05. i. සෝනක ජාතක කතාවෙන් ගත හැකි ආදර්ශ හතරක් ලියන්න.

ii. සෝනක ජාතක කතාවේ අතීත කතාව ලියන්න.

(ලකුණු 7+8 =15)

06. i. මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු හතරක් නම් කරන්න.

ii. **මාතාපිතු උපට්ඨානං** යන ගාථාව මුල් කර ගනිමින් ධර්ම දේශනාවක් පිළියෙළ කරන්න.

(ලකුණු 7+8 =15)

07. i. **වත්තං න පරිපූරෙන්තො** යන ගාථාව සම්පූර්ණ කර එහි අදහස ලියන්න.

ii. **කායගතාසති භාවනාව** වඩන පිළිවෙළ කෙසේදැ යි විස්තර කරන්න.

(ලකුණු 7+8 =15)

*****

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)
ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)
Year End Term Test – 2021 (2022)

පැය දෙකයි

**ත්‍රිපිටක ධර්මය** | **විභාග අංකය ..............................** | **2 ශ්‍රේණිය**

සැලකිය යුතුයි :

❖ I, II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම ද, III කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

## I කොටස

**01. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. **"මාගේ පැතුම ඉටුවූවා සේම ඔබ වහන්සේගේ පැතුමත් ඉටුවෙත්වා යි"** කියා රන්තලිය සමගින් කිරිබතක් බෝසතාණන් වහන්සේට පූජා කළේ,
   - i. සුමනා සිටු දියණිය යි.
   - ii. සුජාතා සිටු දියණිය යි.
   - iii. පුණ්ණා නම් දාසිය යි.

2. බුදුරජාණන් වහන්සේ විසින් තමා අවබෝධ කළ ධර්මය ගුරු තනතුරේ තබා ගැනීමට තීරණය කළේ,
   - i. පළමුවන සතියේ ය.
   - ii. දෙවන සතියේ ය.
   - iii. පස් වන සතියේ ය.

3. බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන්ට දහම් දෙසීමට බරණැස් නුවර ඉසිපතන මිගදාය බලා වැඩම කරද්දී අතර මඟදී හමුවූයේ,
   - i. තපස්සු හා භල්ලුක ය.
   - ii. ජීවක වෛද්‍යවරයා ය.
   - iii. උපක ආජීවකයා ය.

4. බුදු සසුනේ ප්‍රථම තේවාචික උපාසකතුමා ලෙස හඳුන්වන්නේ,
   - i. සුද්ධෝදන රජතුමා ය.
   - ii. බරණැස් සිටුතුමා ය.
   - iii. යස කුල පුත්‍රයා ය.

5. යසකුල පුත්‍රයාගේ පැවිදි බව අසා විමල, සුබාහු, පුණ්ණජී, ගවම්පති යන හතර දෙනා ද පැවිදිව රහත් වූහ. ඉන් අනතුරුව, ඔවුන්ගේ යහළුවෝ කී දෙනෙක් පැවිදිව රහත්වී ද ?
   - i. 50 කි.
   - ii. 54 කි.
   - iii. 55 කි.

6. බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව වූ වේළුවනාරාමය පූජා කළේ,
   - i. සුද්ධෝදන රජතුමා ය.
   - ii. කොසොල් රජතුමා ය.
   - iii. බිම්බිසාර රජතුමා ය.

7. බුදුරජාණන් වහන්සේ පළමු වරට කිඹුල්වත්පුරයට වැඩම වූ අවස්ථාවේ සුද්ධෝදන රජුට දේශනා කළේ,
   - i. සෝණක ජාතකය යි.
   - ii. මහා ධර්මපාල ජාතකය යි.
   - iii. සීල විමංස ජාතකය යි.

8. ධම්මපදයේ යමක වග්ගයේ දැක්වෙන **"ඉධ මෝදති පෙච්ච මෝදති"** යන ගාථාව දේශනා කළේ,

i. ධම්මික උපාසක උදෙසා ය. ii. සුමනා දේවිය උදෙසා ය.
iii. චුන්ද සූකර උදෙසා ය.

9. බුදුරජාණන් වහන්සේ "මව්පියන්ගේ අවසරයක් නොමැතිව දරුවන් පැවිදි නොකරන්නැයි." විනය නීතියක් පැනවූ සේක. ඊට හේතු වූයේ,

i. නන්ද කුමරුගේ පැවිද්ද යි. ii. සිදුහත් කුමරුගේ පැවිද්ද යි.
iii. රාහුල කුමරුගේ පැවිද්ද යි.

10. අශෝක රජතුමා **"චණ්ඩාසෝක"** නමින් ප්‍රකට වූයේ,

i. බුද්ධිමත්, එඩිතර, රණකාමී බව නිසා ය.
ii. තම සොහොයුරන් අනූනව දෙනා මරා රජ වූ නිසා ය.
iii. දිග් විජය ප්‍රතිපත්තිය අනුගමනය කළ නිසා ය.

(ලකුණු 2 × 10 = 20)

## II කොටස

**02. මෙම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1. බුදුරජාණන් වහන්සේට විළඳ හා මී පිඬු පිළිගැන්වූයේ කවුරුන් විසින් ද?
2. සසර දුකින් මිදෙනු කැමති තැනැත්තා විසින් අත්හළ යුතු අන්ත දෙක නම් කරන්න.
3. චතුරාර්ය සත්‍යයේ පළමු අංග දෙක නම් කරන්න.
4. තෙරුවන් සරණගිය පළමු උපාසිකාවන් දෙදෙනා කවුරුන් ද?
5. සාරිපුත්ත හා මොග්ගල්ලාන යන තෙරවරුන්ගේ ගිහිකල නම් මොනවාද?
6. ආනන්ද හිමියන් අග්‍ර උපස්ථායක තනතුරට පත් වීමට පෙර බුදුරජාණන් වහන්සේට උපස්ථාන කළ තෙරවරු දෙදෙනෙක් නම් කරන්න.
7. යසෝධරා දේවියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.
8. බෞද්ධ භාවනාවේ ප්‍රධාන බෙදීම් දෙක නම් කරන්න.
9. **"සීලං කිරෙව කල්‍යාණං ......"** යන ගාථාව සම්පූර්ණ කරන්න.
10. " **අසේවනා ච බාලානං**
    **පණ්ඩිතානං ච සේවනා**
    **පූජා ච පූජනීයානං**
    **එතං මංගලමුත්තමං"** යන ගාථාවේ තේරුම ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

## III කොටස

**03.** I. පහත සඳහන් ගාථා වලින් දෙකක් සම්පූර්ණ කරන්න.

- **අසාරේ සාර මතිනෝ .................**
- **ඉධ නන්දති පෙච්ච නන්දති..........**
- **උට්ඨානවතෝ සතිමතෝ......**

II. ඉහත ගාථා අතරින් ඔබ කැමති එක් ගාථාවක නිදාන කථාව කෙටියෙන් ලියන්න.

(ලකුණු 8 + 7 = 15)

**04.** I. මහා ධර්මපාල ජාතක කථාව කෙටියෙන් ලියන්න.

II. එම ජාතක කථාවෙන් අපට ගත හැකි ආදර්ශ මොනවාදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 8 + 7 = 15)

**05.** I. මංගල සූත්‍රයේ නිදාන කථාව කෙටියෙන් ලියන්න.

II. **"බාහු සච්චඤ්ච සිප්පඤ්ච"** යන ගාථාව මුල් කර ගනිමින් ශිෂ්‍ය සමිතියේ ඉදිරිපත් කිරීමට සුදුසු කථාවක් ලියන්න.

(ලකුණු 8 + 7 = 15)

**06.** I. අසුභ භාවනාවේ තචපඤ්චකය එහි අර්ථ සමග ලියන්න.

II. භාවනා කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල පහක් ලියන්න.

(ලකුණු 8 + 7 = 15)

**07.** I. සේඛියාවන්හි පරිමණ්ඩල වග්ගයට අයත් සේඛියා පහක් ලියන්න.

II. ඔබ දිනපතා විහාරවත සිදුකරන ආකාරය පහදන්න.

(ලකුණු 8 + 7 = 15)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விக் பிரிவு
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය දෙකයි

**ත්‍රිපිටක ධර්මය** විභාග අංකය : ........................................... **2 ශ්‍රේණිය**

❖ I හා II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම ද, III කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. බුදු දහමට අනුව පෙර ආත්ම භාවයන් දැකීමේ නුවණ හැඳින්වෙන්නේ,
   (1) පුබ්බේනිවාසානුස්සති ඤාණය ලෙස ය. (2) දිබ්බචක්ඛු ඤාණය ලෙස ය.
   (3) චුතූපපාත ඤාණය ලෙස ය.

2. බුදුරජාණන් වහන්සේට "ආවුසෝ" වාදයෙන් ඇමැතීම සුදුසු නො වන බව පෙන්වා දුන්නේ,
   (1) යසකුල පුත්‍රයා ඇතුළු පිරිසට ය. (2) කොණ්ඩඤ්ඤ තවුසා ඇතුළු පිරිසට ය.
   (3) තුන් බෑ ජටිලයින් ඇතුළු පිරිසට ය.

3. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මාආජීව යනුවෙන් අර්ථවත් වන්නේ,
   (1) යහපත් උත්සාහය යි. (2) යහපත් දිවි පැවැත්ම යි.
   (3) යහපත් ක්‍රියාව යි.

4. .............................. බුදු සසුනේ පළමු තේවාචික උපාසක තුමා ය.
   (1) මිගාර සිටුතුමා (2) අනේපිඬු සිටුතුමා (3) බරණැස් සිටුතුමා

5. බුදුරජාණන් වහන්සේ විසින් "සඳ කිඳුරු ජාතකය" දේශනා කරනු ලැබුවේ,
   (1) මහා ප්‍රජාපතීගෝතමී දේවියට ය. (2) යශෝධරා දේවියට ය.
   (3) මල්ලිකා දේවියට ය.

6. කළගුණ සැලකීමේ උදාර ගුණය ලොවට පෙන්වා දෙනු පිණිස බුදුරජාණන් වහන්සේ විසින් අනිමිස ලෝචන පූජාව සිදු කරනු ලැබුවේ,
   (1) බුද්ධත්වයෙන් පළමු සතියේ ය. (2) බුද්ධත්වයෙන් දෙවන සතියේ ය.
   (3) බුද්ධත්වයෙන් තෙවන සතියේ ය.

7. ශාසනික ප්‍රතිපදාව අනුව කටයුතු කිරීමේ දී වැඩිහිටියාට මූලිකත්වය හිමි වේ. එහෙත් එක් ස්ථානයක දී පමණක් පැමිණි පිළිවෙළ නො ඉක්මවිය යුතු ය. එය සඳහන් වන්නේ,

(1) ජන්තාඝර වතෙහි දී ය. (2) හත්තග්ග වතෙහි දී ය.

(3) වච්චකුටි වතෙහි දී ය.

8. "ඔබේ ඉඳුරන් ප්‍රසන්න ය. ඔබේ ශරීර වර්ණය පැහැපත් ය. ඔබගේ ගුරුවරයා කවරෙක් ද? ඔබ අදහන්නේ කාගේ ධර්මයක් දැ යි" බුදුරජාණන් වහන්සේගෙන් විමසන ලද්දේ,

(1) ආළාරකාළාම විසින් ය. (2) උපක විසින් ය. (3) අස්සජි විසින් ය.

9. තච පඤ්චකයට අයත් වන්නේ,

(1) කෙස් , ලොම් , නහර , ඇට , ඇට මිදුලු ය. (2) කෙස් , ලොම් , නිය , මස් , හදවත ය.

(3) කෙස් , ලොම් , නිය , දත් , සම ය.

10. "න හත්ථනිල්ලේහකං භුඤ්ජිස්සාමී'ති සික්ඛා කරණීයා" යන්නෙහි නිවැරදි අර්ථය වනුයේ,

(1) අත ලෙවකමින් නො වළඳිමි යි හික්මිය යුතු යි.

(2) දිවෙන් තොල් ලෙවකමින් නො වළඳිමි යි හික්මිය යුතු යි.

(3) පාත්‍රය ලෙවකමින් නො වළඳිමි යි හික්මිය යුතු යි.

(ලකුණු 2 × 10 = 20)

## II කොටස

02. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I. චතුරාර්ය සත්‍යයෙහි පිළිවෙළ අනුව තුන්වන හා හතරවන අංග දෙක ලියා දක්වන්න.

II. රජවරුන් යුද්ධ කොට අවට ප්‍රදේශ හෝ රටවල් අත්පත් කරගැනීම හැඳින්වෙන නම කුමක් ද?

III. "අප්පසන්නානං වා පසාදාය, පසන්නානං වා භීයොයා භාවාය" යන බුද්ධෝපදේශයෙහි සරල අදහස ලියන්න.

IV. ආනන්ද තෙරුන් විසින් අග්‍ර උපස්ථායක තනතුර භාර ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේ වෙත ඉදිරිපත් කරන ලද කොන්දේසි අටෙන් දෙකක් ලියන්න.

V. චතුසම්පජඤ්ඤය නම් කරන්න.

VI. ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් අංග හතරක් ලියන්න.

VII. කෙනෙකු සක්දෙව් රජ පදවිය ලබා ගැනීමට පිරිය යුතු වත් දෙකක් නම් කරන්න.

VIII. දෙව්දත් තෙරුන් විසින් බුදුරජාණන් වහන්සේ වෙත ඉදිරිපත් කරන ලද පංච වර අතරින් දෙකක් ලියන්න.

IX. භික්ෂුව විසින් අත් හළ යුතු අන්ත දෙක නම් කරන්න.

X. "යේ ධම්මා හේතුප්පභවා" යන ගාථාව අසා සෝවාන් වූ කුමාරවරු දෙදෙනා නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

## III කොටස

03. පහත දැක්වෙන ගාථාවලින් තුනක් සම්පූර්ණ කරන්න.

I. දුක්ඛං දුක්ඛ සමුප්පාදං....

II. අප්පමාදෝ අමතපදං....

III. පරෙ ච න විජානන්ති....

IV. අක්කොච්ඡි මං අවධි මං....

(ලකුණු 5 × 3 = 15)

04. I. "දිට්ඨ මංගල, සුත මංගල, මුත මංගල" යන්නෙහි අර්ථ වෙන වෙන ම ලියා දක්වන්න.

II. "මාතාපිතු උපට්ඨානං" යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.

(ලකුණු 6 + 9 = 15)

05. I. නිග්‍රෝධ හිමියන්ගේ චරිතයෙන් භික්ෂුවකට ගත හැකි ආදර්ශ තුනක් ලියන්න.

II. ධර්මාශෝක රජතුමාගෙන් සම්බුදු සසුනට සිදු වූ සේවාව ලියන්න.

(ලකුණු 6 + 9 = 15)

06. I. මහා ධම්මපාල ජාතක කතාවෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ හයක් ලියන්න.

II. සෝණක ජාතක කතාව කෙටියෙන් ලියන්න.

(ලකුණු 6 + 9 = 15)

07. I. තුදුස් (14) වත් අතරින් හයක් නම් කරන්න.

II. ඔබ විසින් නම් කළ වත් අතරින් එකක් සිදු කරන ආකාරය ලියන්න.

(ලකුණු 6 + 9 = 15)

08. I. බුදුසසුනේ ප්‍රථම රහතන් වහන්සේලා හැට නම කවුරුන් ද?

II. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩමවීමේ දී සිදු වූ විශේෂ **අවස්ථා** විස්තර කරන්න.

(ලකුණු 6 + 9 = 15)

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 03 | S | I |
|---|---|---|

**පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)**

**02 ශ්‍රේණිය**

**පැ දෙකයි.**

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## (3) ත්‍රිපිටක ධර්මය

**සැලකිය යුතුයි :**

- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100 ක් ලැබේ.
- දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.
- I, II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම ද, III කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකට ද පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

1. රජ සැප හැරදමා, සත්‍යය සොයා ගිය සිදුහත් බෝසතාණන් වහන්සේට පළමු ව ............. තාපසතුමා හමු විය.
   (1) ආළාරකාළාම (2) උරුවේල කාශ්‍යප (3) උද්දකරාම පුත්ත
2. බුදුරජාණන් වහන්සේ තම සිරුරින් සවණක් ගණ බුද්ධ රශ්මිය විහිදුවමින් අභිධර්මය මෙනෙහි කරනු ලැබුයේ ........
   (1) අජපාල නුගරුක මුල වැඩ සිටිමින් ය.
   (2) මුචලින්ද සෙවනෙහි වැඩ සිටිමින් ය.
   (3) රුවන්ගෙයි වැඩ සිටිමින් ය.
3. තපස්සු සහ හල්ලුක වෙළඳ දෙබෑයෝ බුදුරජාණන් වහන්සේ දැක පැහැදී .................... පූජා කළහ.
   (1) කුසතණ (2) කිරි පිඬු (3) විළඳ සහ මී පිඬු
4. බුදුරාජාණන් වහන්සේ ත්‍රිලක්ෂණය ඇතුළත් ............. දේශනා කළ සේක.
   (1) අනන්තලක්ඛණ සූත්‍රය (2) දසධම්ම සූත්‍රය (3) මහා පරිනිබ්බාන සූත්‍රය
5. තුන්බෑ ජටිලයන් අතරින්, නදී කාශ්‍යප ඇතුළු පිරිස රහත්භාවයට පත් වූයේ ............. ශ්‍රවණය කිරීමෙන් පසු ය.
   (1) තිරෝකුඩ්ඩ සූත්‍රය (2) ආදිත්ත පරියාය සූත්‍රය (3) ලක්ඛණ සූත්‍රය
6. බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකා ගමනය සිදු වූයේ .......... පුර පසළොස්වක පෝහෝ දිනයේදී ය.
   (1) දුරුතු (2) නවම් (3) මැදින්
7. බුදු සසුනේ ප්‍රථම ......................... උපාසක තුමා වූයේ බරණැස් සිටුතුමා ය.
   (1) අග්‍ර උපස්ථායක (2) තේවාචික (3) ද්වේවාචික
8. මහා ධර්මපාල ජාතකය දේශනා කොට වදාළේ .............. රජු අරහයා ය.
   (1) බිම්බිසාර (2) සුද්ධෝදන (3) කොසොල්
9. සුමන සමන් දිව්‍ය රාජයා බුදුරජාණන් වහන්සේගෙන් පිදීමට වස්තුවක් ඉල්ලා සිටි අවස්ථාවේ, තම හිස පිරිමැද කේසධාතු මිටක් ලබා දුන්හ. හෙතෙම එය තැන්පත් කොට .................... ඉදි කළේය.
   (1) නාගදීප චෛත්‍යය (2) කැලණි චෛත්‍යය (3) මහියංගණ චෛත්‍යය
10. යශෝදරා මහරහත් තෙරණිය සම්බුද්ධ සාසනයේ .................. අග තනතුර ලැබුවා ය.
   (1) ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර (2) චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර (3) විනයධර භික්ෂුණීන් අතර

**(ලකුණු 2 X 10 = 20)**

## II - කොටස

[ 2 වැනි පිටුව බලන්න]

**02. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. චණ්ඩාශෝක රජු, නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ කෙරෙහි පැහැදීමට හේතු **දෙකක්** ලියන්න.
ii. සිවුවනක් පිරිස අතරින් **දෙපිරිසක්** නම් කරන්න.
iii. පංචානන්තරිය පාප කර්ම අතරින් **දෙකක්** ලියන්න.
iv. දේවදත්ත හිමියන් විසින් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලූ පංචවරය අතරින් **දෙකක්** ලියන්න.
v. ත්‍රිවිද්‍යා අතරින් **දෙකක්** ලියන්න.
vi. චතුරාර්ය සත්‍යය අතරින් **දෙකක්** ලියන්න.
vii. අස්සජී තෙරුන්ගේ මග පෙන්වීමෙන් ධර්ම මාර්ගයට පිවිසි ශ්‍රාවකයන් **දෙදෙනා** නම් කරන්න.
viii. කොසඹෑනුවර ඝෝෂිතාරාමයේ දී තථාගතයන් වහන්සේ වදාළ **ජාතක කථා දෙක** නම් කරන්න.
ix. අෂ්ට ගරුධර්ම අතරින් දෙ**කක්** නම් කරන්න.
x. තථාගතයන් වහන්සේ විසින් දේශිත අත්හල යුතු අන්ත **දෙක** නම් කරන්න.

**(ලකුණු 2 X 10 = 20)**

## III කොටස

**03. i. පහත සඳහන් ගාථාවලින් දෙකක් සම්පූර්ණ කරන්න.**

a) සාරං ච සාරතො ඤත්වා ...............................
b) අප්පමාදො අමත පදං ...................................
c) පතිරූප දෙස වාසො ච .................................
d) දුන්නිග්ගහස්ස ලහුනො .................................

ii. **නහි වේරෙන වේරානි** යන ගථාවට අදාළ නිදාන කතාව ලියන්න.

**(ලකුණු 10 + 5 = 15)**

04. i. දෙතිස් කුණප අතරින් **පහක්** නම් කරන්න.
ii. පිළිකුල් භාවනාව වඩන ආකාරය පැහැදිලි කරන්න.

**(ලකුණු 5 + 10 = 15)**

05. i. මහා මංගල සූත්‍රය දේශනා කිරීමට අදාළ නිදාන කථාව ලියන්න.
ii. **අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා** ගාථා පාඨය ඇසුරින් සඟරාවකට ලිපියක් ලියන්න.

**(ලකුණු 5 + 10 = 15)**

06. i. ශක්‍ර දේවේන්ද්‍රත්වයට පත්වීමට පිරිය යුතු පිළිවෙත් **පහක්** ලියන්න.
ii. සක් දෙවිඳුට එම පදවිය ලැබීමේ කතා පුවත විස්තර කරන්න.

**(ලකුණු 5 + 10 = 15)**

07. i. තුදුස් වත් අතරින් **පහක්** නම් කරන්න.
ii. ඒවායෙන් **එකක්** පිළිබඳ විස්තර කරන්න.

**(ලකුණු 5 + 10 = 15)**

08. i. මහා ධර්මපාල ජාතකය ඇසුරින් අඩු වයසින් මරණයට පත් නොවීමට හේතු වන කරුණු **තුනක්** උපුටා දක්වන්න.
ii. **සීලවිමංස ජාතකය** ඇසුරෙන් සිල් රැකීමේ අගය විස්තර කරන්න.

**(ලකුණු 7 + 8 = 15)**

* * *